## 20 වන සියවසේ මහා පුරුෂයෝ

# ගැලීලියෝට, නිව්ටන්ට, අයින්ස්ටයින්ට පසුව බිහිවූ මහා දාර්ශනිකයා ස්ටීවන් හෝකින්

ලෝකයේ එදා මෙදා තුර බිහිවූ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයින් බොහෝ දෙනෙක් ගැන අප අසා තිබෙනවා. ඔවුන් අපේ කාලයේ මෙලොව විසූවන් නොවෙයි. එහෙත් අපේ කාලයේදීත් විද්‍යා ලෝකය බබලවනු ලබන විද්‍යාඥයින් ද සිටිනවා. ඔවුන් අතරින් ඉතා කීර්තිධර වගේ ම ඓතිහාසික කාර්ය භාරයක නිරතවන චරිත සංඛ්‍යාව අතලොස්සක්. මොවුන් අතරින් ඉතා ඉහළ ගණයේ ලා සැලකෙන විද්‍යාඥයෙක් වන්නේ ස්ටීවන් හෝකින්. ඔහු විසින් දැන් නිර්මාණය කරමින් සිටින්නේ විද්‍යාවේ ඉතා වැදගත් සංවර්ධනීය අවස්ථාවක්. ඔහු ගේ සොයා ගැනීම් නිසා ඇතැම්විටෙක න්‍යායාත්මක භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් දියුණුවේ අවසානයට පැමිණිය හැකියි.

දැන් අපි දන්නා විද්‍යාවේ ස්වරූපය එකවර ම ඇතිවූවක් නොවෙයි. විද්‍යා ඉතිහාසයේ විශේෂ යුග තිබෙනවා. න්‍යායාත්මක භෞතික විද්‍යාව මේ සියල්ල අතරින් ප්‍රමුඛ යි. ලෝකය තාක්ෂණීය කරණය කළේ, න්‍යායාත්මක භෞතික විද්‍යාවෙන්.

ගැලීලියෝ ගැලීලී විද්‍යාවේ බොහෝ අංග වෙනස් කළා. 1609 දී සූර්යයා විශ්වයේ කේන්ද්‍රය නොවන බව ඔහු ප්‍රකාශ කිරීම විද්‍යා ඉතිහාසයේ සන්ධිස්ථානයක්.

විද්‍යාවේ මීළඟ දැවැන්ත පිම්ම තැබුවේ අයිසෙක් නිව්ටන් ගේ සොයා ගැනීම්වල උපකාරයෙන්. 1687 දී ඔහු ගුරුත්වාකර්ෂණ සංකල්පය අර්ථ දැක්වූවා. මෙතෙක් පැවැති විද්‍යාවේ මතවාද ඉන් නව මඟකට පැමිණියා.

නිව්ටන්ගේ විද්‍යාව වෙනස් කළේ අයින්ස්ටයින් විසින්. වර්ෂ 1905 දී ඉදිරිපත් කළ විශේෂ සාපේක්ෂතාවාදයත් 1915 දී අයින්ස්ටයින් ඉදිරිපත් කළ සාමාන්‍ය සාපේක්ෂතාවාදයත් මේ සියවසේ මහා සොයාගැනීම් බව අවිවාදිත යි.

ගැලීලියෝගෙන් ආරම්භ වූ මේ නව අදහස් පරම්පරාව නිව්ටන් හරහා අයින්ස්ටයින්ගෙන් පෝෂණය වූවත් එය තවමත් සම්පූර්ණ වී නැහැ. මේ න්‍යායන් මඟින් විශ්වය පිළිබඳ භෞතික ආකෘතියක් සකසා ගැනීමට තවමත් හැකිවී නැහැ.

එහෙත් දැන් එයට මඟ පෑදී තිබෙන සෙයකි. ස්ටීවන් හෝකින් අතගසා සිටින්නේ එම කටයුත්තට යි. සාපේක්ෂතාවාදය, ක්වොන්ටම්වාදය හා ගළපමින් භෞතික විද්‍යාව එහි අවසන් සංවර්ධනීය අවධියට ගෙන යාමට ඔහු කැපවී කටයුතු කරනවා.

එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ න්‍යායාත්මක භෞතික විද්‍යා හා ව්‍යවහාරික ගණිත දෙපාර්තමේන්තුවේ සේවය කරන ස්ටීවන් හෝකින් වෘත්තීමය වශයෙන් උසුලන්නේ මහා විද්‍යාඥ ශ්‍රීමත් අයිසෙක් නිව්ටන් කේම්බ්‍රිජ් සරසවියේ දී ඉසිලූ මහාචාර්ය තනතුර යි.

ඒ කෙසේ නමුත් මහාචාර්ය හෝකින් දරුණු අංශභාග රෝගියෙක් වීම විශේෂ කාරණයක්. දැනට කථාකිරීමේ හැකියාව පවා අහිමි මේ විද්වතා අයින්ස්ටයින්ගෙන් පසුව මේ සියවසේ උපන් ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයා වශයෙන් සැලකෙනවා. මේ අංශභාග රෝගී මහාචාර්යවරයා දැනට බාහිර අයවළුන් සමග අදහස් හුවමාරු කරගන්නේ ඔහු වෙනුවෙන් ම විශේෂයෙන් තැනූ හඬ ලබා දෙන උපකරණයක් හෙවත් හඬ සංස්ලේෂණ (Voice synthesisier) උපකරණයක් අනුසාරයෙනි. පරිගණකයකට සම්බන්ධ මේ උපකරණයෙන් ඔහු තමන්ගේ අදහස් "ටයිප්" කරන අතර ඒවා පරිගණකගත හඬකින් පිටතට ඇසේ. කොහොම නමුත් හෝකින්ට කන් ඇසීමේ හැකියාව තවමත් තිබෙන බැවින් මෙය සාර්ථක උපක්‍රමයක්!



කේම්බ්‍රිජ් සරසවියේ නිතිපතා දේශන පවත්වන මේ මහා විද්‍යාඥයා, ලෝක ප්‍රකට වී සිටින්නේ අතිශය වැදගත් බුද්ධි මෙහෙවරක ඔහු නියැලීම හේතුවෙන්.

**මේ සියවසේ මහා සොයාගැනීම් දෙක සේ සැලකෙන මාක්ස් ප්ලාන්ක්ගේ ක්වොන්ටම්වාදයත්, ඇල්බට් අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදයත් එකිනෙකට ගලපමින් විශ්වයේ මූලික ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන න්‍යායක් හෙවත් විශ්වීය පොදු න්‍යායක් (Theory of everything) ගොඩනැංවීමේ කටයුත්තේ ඔහු නියැලී සිටිනවා.**

ලෝකයේ දැනට සිටින ඉතා ජනප්‍රියම හා ප්‍රසිද්ධම විද්‍යාත්මක චින්තකයා සේ සැලකෙන හෝකින්, පසුගියදා ජාත්‍යන්තර මාධ්‍යවේදියකුට පුවත්පත් සාකච්ඡාවක් ලබා දීමට කටයුතු කොට තිබුණා. ලන්ඩනයේ ද ටෙලිග්‍රාෆ් (The telegraph) සමාගම වෙනුවෙන් මාධ්‍යවේදී නයිජෙල් ෆාන්ඩේල් ඒ අවස්ථාව ලබාගත් මාධ්‍යවේදියා යි.

ගැලීලියෝගෙන් ආරම්භ වු මේ නව අදහස් පරම්පරාව නිව්ටන් හරහා අයින්ස්ටයින්ගෙන් පෝෂණය වුවත් එය තවමත් සම්පූර්ණ වී නැහැ. මේ න්‍යායන් මඟින් විශ්වය පිළිබඳ භෞතික ආකෘතියක් සකසා ගැනීමට තවමත් හැකිවී නැහැ. එහෙත් දැන් එයට මඟ පෑදී තිබෙන සෙයකි. ස්ටීවන් හෝකින් අතගසා සිටින්නේ එම කටයුත්තට යි.

ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් සමඟ ගත කළ ඒ ආස්වාදනීය හෝරාවන් ගෙවී ගිය අයුරු ෆාන්ඩේල් ලියා තිබුණේ මෙසේ යි.

## ඔහු මරණය පරාජය කළා

ඔහු (ස්ටීවන් හෝකින්) සිනහවෙමින් යාන්ත්‍රික රෝද පුටුවක අසුන්ගෙන සිටියා. මහාචාර්ය ස්ටීවන් හෝකින් මා සමඟ කථා කළේ, තමන්ගේ පරිගණකයේ හඬින්.

කොහොම නමුත් ඔහු සමඟ කථාබහේ යෙදීම දීර්ඝ කාලයක් ගතවූ කටයුත්තක් වූවා. විනාඩියකට වචන 15–20 ක් පමණයි ඔහුට තමන්ගේ පරිගණකයෙන් ඇසෙන්නට සලස්වන්නට පුළුවන් වුණේ.

ඔහු චාලක ස්නායු පද්ධතියේ දරුණු රෝගයකින් පෙලෙනවා. ඔහු මේ රෝගයෙන් පෙලෙන බව අනාවරණය වූයේ, වයස අවුරුදු 21 දීයි. බොහෝ දෙනෙක් – විශේෂයෙන් ම වෛද්‍යවරු – ඔහු ගේ ආයු කාලය තවත් අවුරුදු දෙක තුනකින් කෙළවර වේ යැයි කීවත් මේ වන තෙක් ම ජීවතුන් අතර සිටින ඔහු ගේ වයස අවුරුදු 57 ක්.

ඔහු මරණය පරාජය කළා. එහෙත් ඔහු දරුණු අංශභාග රෝගියෙක් වී හමාරයි. වකුටු වී ගිය ඇඟිලිවලට පමණයි තරමක හෝ චලනයක් ඇති කළ හැක්කේ. ඒ වගේ ම ඔහුගේ මුහුණේ පේශී තවමත් ක්‍රියා කරයි.

"ඔව්" යන්න ඇඟවීමට ඇහිබැම එසවීමටත්, "නැහැ" යන්න ඇඟවීමට ඇසක් කුඩා කිරීමටත් ඔහුට හැකියාව තවමත් ඉතිරිව තිබෙනවා.

ඔහු අනුන් සමඟ කථා බහේ යෙදෙන්නේ පරිගණකයේ ගබඩා කළ, අකුරු, වචන මෙන් ම වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය පිළිවෙලට සැකසීමෙන්.

ඒවා අන් අයට ඇසෙන්නේ රොබෝ හඬකින්. ඉතින් මට බොහෝ දේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමේ අවස්ථාව කොහොමටවත් ලැබෙන්නේ නැහැ.

## ඉදිරි සියවසේදී මිනිසුන් අභ්‍යවකාශයේ පදිංචි වේවි

මට ඔහුගෙන් ඇසීමට බොහෝ දේ තිබුණා.

පළමුවෙන් ම අපි, අපි ගැනම කල්පනා කළ යුතුයි කියලා මට හිතුණා. ලෝකයේ දැන් උද්ගතවෙලා තිබෙන්නේ අර්බුද සමූහයක්. මම ඔහුගෙන් මුලින් ම ඇසුවේ මිනිසුන් ගේ අනාගතය කොහොම වේවි ද? කියා යි.



ස්ටීවන් හෝකින් හා ඊලයින් මේසන් විවාහ වූදා



ස්ටීවන් හෝකින් කලින් විවාහයේ බිරිඳ සමග

හෝකින් තමන් ගේ සිතුගි ගෙන හැර දැක්වූවා. "ලෝකයේ ජනගහනය දැන් පවතින වේගයෙන් වර්ධනය වුවහොත් තවත් අවුරුදු 40 කදී ලෝක ජනගහනය දෙගුණ වෙනවා. වර්ෂ 2600 වන විට මේ ලෝකය අපිට ඉඩ මදියි" ඉතින් අපට වෙනත් ග්‍රහලෝක වලට යන්න බැරිද? ප්‍රශ්නය මගෙන්. හෝකින් ගේ අත් වේගයෙන් ක්‍රියාත්මක වුණේ මට පිළිතුරක් ලබා දීමට. පරිගණක හඬින් මට පිළිතුරු ලැබෙනවා. "මං හිතන්නේ ඊළඟ සියවසේදී මිනිසුන් අඟහරු වෙත යාවි. ඒ වුනත් සූර්යග්‍රහමණ්ඩලයේ තිබෙන හොඳම තැන පෘථිවිය යි. අඟහරු පොඩි යි. ශීතල යි. වායුගෝලය අඩු යි.

අනෙක් ග්‍රහලෝක මිනිස් වාසයට අපහසු තැන්. අපට අභ්‍යවකාශ මධ්‍යස්ථාන (Space Stations) වල ජීවත් වෙන්න හරි වෙනත් සූර්යග්‍රහ මණ්ඩලයක් වෙත යාම ගැන හෝ හිතන්න වේවි. කොහොමවුනත් මේවා ඉදිරි සියවසේදී අපට කළහැකි දේවල්"

## එතකොට කාලය ආපස්සට ගමන් කරනවා

වෙනත් සූර්යග්‍රහ මණ්ඩලයකට – ඒ කියන්නේ වෙනත් තරුවක් වෙතට – ළඟාවෙන්න අපි කොපමණ වේගයකින් ගමන් කළ යුතුද යන්න මගේ ඊළඟ ප්‍රශ්නය වුණා.

ක්ලික්.... ක්ලික්.... ක්ලික්.... මට පිළිතුරක් සැකසෙමින් තිබෙනවා. "මම හිතන්නේ කොපමණ වෙහෙසුනත් අපට ලෝකයේ වේගය ඉක්මවා ගමන් කරන්න බැහැ. එතකොට කාලය ආපස්සට ගමන් කරනවා.

ඒ නිසා අපට සිද්ධාන්තයක් වශයෙන් හැකියාවක් තිබෙන වේගයෙන් අපේ මන්දාකිණියේ මැදට ගිහින් එන්න අවුරුදු ලක්ෂයක් වත් ගතවේවි. ඒ සඳහාත් දැන් තියෙන රොකට් වැනි දේ ප්‍රමාණවත් නැහැ. නමුත් මිනිස්සු මේ වයම මගහැර යන්නේ නැහැ" මට පිළිතුරු දීමෙන් පසුව ඔහු තමන් ගේ සහයකයාට පැවසුයේ කාමරයේ ජනේලය හැර දමන ලෙසයි. මා ශීතලෙන් ගැහෙන්නට වුවත් ඔහු ගේ සහයකයා වූ ක්‍රිස් පැවසුයේ මහාචාර්යවරයා ශීතලට කැමති බවයි. මම ශීතල මැඩගෙන ඊළඟ ප්‍රශ්නය යොමු කළා.

ඉදිරියේ දී පරිණාමය කෘත්‍රිමව වේගවත් කරාවි.

මිනිස් වර්ගයා වෙනස් වෙමින් සිටිනවා ද? එහෙමත් නැත්නම් දැනුම පිළිබඳ සුවිශේෂ මට්ටමකට ළඟා වෙමින් සිටිනවා ද? හෝකින් ගේ දෑත් ක්‍රියාත්මක වුණා. පරිගණකය මට කථා කළා. "ඊළඟ අවුරුදු 100 දී හෝ එහෙමත් නැත්නම් ඉදිරි අවුරුදු 20 තුළදී විශ්වීය පොදු න්‍යාය (Thory of everything) ගොඩනංවන්න පුළුවන් වේවි. ඉන් විශ්වයේ මූලික නියම විස්තර කළ හැකි යි. විශ්වයේ සීමාව ගැන අවබෝධයක් ලබා ගත හැකි වේවි. ඒත් ජීව විද්‍යුත්මක හෝ ඉලෙක්ට්‍රොනික පද්ධතිවල දියුණුවේ සීමාවක් ගැන නොවෙයි කියන්නේ. ඒවා සීමාවක් නැතිව දියුණු වේවි". අපේ සිරුරත් මේ වගේ සංකීර්ණ පද්ධතියක්. පසුගිය වසර 10000 ක කාලයක් පුරාම මිනිසුන්ගේ DNA (එනම් ජාන නැති ඇති ඩිඔක්සිරයිබෝ නියුක්ලෙයික් අම්ල අණු) වල සැලකිය යුතු වෙනස්කම් සිදුවී නැහැ. ඒ කියන්නේ අපේ ජීව විද්‍යාත්මක පරිණාමය හෙමින් සිදුවන්නේ. ඉදිරි අවුරුදු 1000 තුළදී මේ කටයුතු වේගවත් කරන්න පුළුවන් වේවි. ඒ කියන්නේ අපේ මොළයේ ප්‍රමාණය වැඩි කිරීම වගේ කටයුතු වලින්. මිනිසුන් මේ සඳහා ජෛව තාක්ෂණය (Biotechnology) යොද ගනීවි. මිනිස්සු ජාන ඉංජිනේරු විද්‍යාව (Genetic engineering) වගේ ජෛව තාක්ෂණ භාවිතයත් තමන්ට යොදාගැනීම තහනම් කරගෙන. ඒත් මිනිසුන්ට ඒවායින් වැළකී ඉන්න පුළුවන් කමක් තිබෙනවාද කියන එකත් ප්‍රශ්නයක්. අනාගතයේදී මිනිස්සු තමන් ගේ සිරුර සැළසුම් කර ගනීවි.

කොහොමත් දැන් අපි බොහෝ දේ කථා කළා. කථාව අවසන් කරන්න ළඟයි. මම ඔහුගෙන් ඇසුවේ ඔබ ගැන විස්තර කරන්න යොදන්න පුළුවන් වචන තුනක්. මහාචාර්ය හෝකින් පැවසුයේ "අධිෂ්ඨාන සහගතබව, සුභවාදී බව.... මට තුන්වැන්න හිතන්න බැහැ. හැබැයි බිරිඳගෙන් ඇසුවොත් කියාවි මුරණ්ඩු කම කියා" යනුවෙන්.

වර්ෂ 1985 දි මහාචාර්ය වරයාගේ ගලනාලයේ (අන්නස්‍රෝතය) ශල්‍යකර්මයක් සිදු කළා. ඔහුට කථා කිරීමේ හැකියාව නැතිව ගියේ ඉන් පසුව යි. ඉතින් ඔහු ගේ පෙනහල්ලට ආහාර කැබලි නිරන්තරයෙන් ඇතුළුවීමේ අවදානමක් තිබෙනවා. හෙදියක් විසින් විශේෂ උපකරණයකින් ඉවත් කිරීම (regular Suction) සිදුකරනවා.

## අභියෝග ජයගන්න කෘත්‍රිමව තැනූ මිනිසුන් ?

දැන් පැය හතරක් ගතවෙලා. සාකච්ඡාව සිදුවන්නේ බොහොම හෙමින්. ඒ අතර හෙදියක් පැමිණියා. මම කාමරයෙන් ඉවත් වූවා. වර්ෂ 1985 දි මහාචාර්ය වරයාගේ ගලනාලයේ (අන්නස්‍රෝතය) ශල්‍යකර්මයක් සිදු කළා. ඔහුට කථා කිරීමේ හැකියාව නැතිව ගියේ ඉන් පසුව යි. ඉතින් ඔහු ගේ පෙනහල්ලට ආහාර කැබලි නිරන්තරයෙන් ඇතුළුවීමේ අවදානමක් තිබෙනවා. හෙදියක් විසින් විශේෂ උපකරණයකින් ඉවත් කිරීම (regular Suction) සිදු කරනවා. ඒ විතරක් නොවෙයි තේ හැන්දක් පුරා බෙහෙත් පෙතිත් ඔහුට පොවන්නේ තේ සමඟයි. කුඩා දරුවෙකු වගේ එම තේ තමන් ගේ බරොත්තිය (bib) පුරා හලා ගන්නවා. ඔහු ඒ තරමට ම බෙලහීන යි. මේ කටයුතුවලින් පසුව ඔහු නැවතත් කථාව ඇරඹුවා.

"මේ ජාන ඉංජිනේරු විද්‍යාත්මකව මිනිසුන් සැකසීමට උර දෙනවා නොවෙයි. අපි තේරුම් ගන්න ඕනැ කොහොමද අපිට සුභවාදී විදිහට ඒවා සමඟ කටයුතු කරන්නේ කියා. අපේ මානසික වගේ ම භෞතික ගුණාංගත් අනිවාර්යයෙන් ම දියුණු කළ යුතුයි. අභ්‍යවකාශ චාරිකා වැනි අභියෝග ජයගන්න එය අවශ්‍ය යි."

## කොම්පියුටරයට වඩා ගැඩවිලෙක් සංකීර්ණ යි !

"අපට අවශ්‍ය වන්නේ ඉලෙක්ට්‍රොනික පද්ධතිවලට වඩා සංකීර්ණ ජීව විද්‍යුත්මක පද්ධති. පරිගණකය සෑම මාස 18 කට ම වරක් සංකීර්ණ බවින් දෙගුණ වෙනවා. ඒත් ඒවා බුද්ධිමත් නැහැ. දැන් තියෙන පරිගණක ගැඩවිලෙක් තරමවත් සංකීර්ණ නැහැ. ගැඩවිලෙක් කියන්නේ බුද්ධියේ ඉමටවත් ළඟා නොවූ සරල සතෙක්. යම් දිනෙක පරිගණක මිනිස් බුද්ධියට – මොළයේ සංකීර්ණ බවට – ළඟා වෙද යන්න සැක යි. විද්‍යුත් පද්ධතියක් හා රසායනික අණු මඟින් සංකීර්ණ බව පවත්වාගෙන යන (මොළය වැනි) පද්ධතියක් අතර වෙනස්කම් බොහෝ යි. සංකීර්ණ බව නොවෙයි බුද්ධිමත් බව කියන්නේ. මිනිස් මොළයට පුළුවන් පරිගණකයක් සැලසුම් කරන්න. පරිගණකයක් බුද්ධිමත් නම් එයාටත් පුළුවන් වෙන්න ඕනැ පරිගණකයක් අලුතින් සැලසුම් කරන්න."

## ඉදිරි සියවසේ දී මව්කුසින් පිටතදී දරුවන්

"මම හිතන්නේ ඉදිරි වසර 100 තුළදී මිනිසුන්ට හැකියාව ලැබේවි සම්පූර්ණයෙන් ම මව් කුසින් පිටතදී දරුවන් හදන්න. එතකොටයි පුළුවන් වෙන්නේ මොළයේ ප්‍රමාණය විශාල කරන්න. දැන් එය කරන්න අමාරු යි.

දැන් දරුවෙක් උපදින කොට කොතරම් වෙහෙසක් දරනවා ද තමන් ගේ ඔළුව එළියට දගන්න. මම මගේ දරුවන් තුන් දෙනා ම උපදිනවා දැක්කා. ඔවුන් දරන වෙහෙසට අනුව තවත් ඔළුව ලොකු වුනොත්...

අනෙක් අතට පරිගණක වේගවත් කිරීමේත් භෞතික බාධාවන් තිබෙනවා. ආලෝකයේ වේගය වගේ ම මිනිස් මොළයේ තීක්ෂණ බවයි ඒ.

මේවා මැඩගෙන පරිගණක දියුණු කිරීමේ ක්‍රමයක් වශයෙන් ඒවා කුඩා කිරීම ගත හැකියි. ඒත් පරමාණුක මට්ටමේදී ඒ කටයුත්තත් සීමා වෙනවා."

### පිටසක්වළ බුද්ධිමත් ජීවීන් නැහැ

දැන් මට අවස්ථාව ආවේ ලොකුම ප්‍රශ්නය අහන්න. **ඉදිරි සහස්‍රකයේදිවත් පිටසක්වල ජීවීන් එක්ක සබඳතා තියාගන්න අපට පුළුවන් වෙයි ද?** 'හෝකින් සිතා-සූතා.' එහු මා වෙන්වෙන් පිළිතුර සැකසූවා.

"විශ්වය ඇතිවුණේ මීට අවුරුදු බිලියන 15 කට කලින් මහා පිපි-රුමෙන්.

Big Bang පොළොවේ මිනිසුන් සම්භවය වී ඇත්තේ මීට අවුරුදු මිලියන දෙකක් වගේ කාලයක් තුළ යි.

ඉතින් අනෙක් ග්‍රහපද්ධතිවල සම්බන්ධයත් එක්ක මේ කාලය සුළු කාලයක්.

ඒ නිසා පිටසක්වල ජීවය අපට වඩා ප්‍රාථමික විය යුතු යි. එහෙමත් නැත්තම් ඉතා දියුණු මට්ටමක තිබිය යුතු යි.

එය ඉතා දියුණු නම් ඇයි විශ්වය පුරා ඔවුන් පැතිරී නොගියේ ? ඇයි පොළොවටත් ආවේ නැත්තේ? ඉතින් මම හිතන්නේ පිටසක්වල ජීවය තවමත් නොදියුණු ප්‍රාථමික අවධියක ඉන්නවා කියල යි.

### බිරිඳ කියයි මා මුරණ්ඩුයි කියලා

කොහොමත් දැන් අපි බොහෝ දේ කථා කළා. කථාව අවසන් කරන්න ළඟයි. මම ඔහුගෙන් ඇසුවේ ඔබ ගැන විස්තර කරන්න යොදන්න පුළුවන් වචන තුනක්. මහාචාර්ය හෝකින් පැවසුයේ **"අධිෂ්ඨාන සහගතබව, සුභවාදී බව.... මට තුන්වැන්න හිතන්න බැහැ. හැබැයි බිරිඳගෙන් ඇසුවොත් කියාවි මුරණ්ඩු කම කියා"** යනුවෙන්.

ඇත්තෙන්ම මහාචාර්ය හෝකින් ඉක්මනින් කේන්ති යන අයෙක්. එහෙත් ඔහු විහිළු-තහළු වලටත් කැමති යි. මරිලින් මොන්රෝගේ කැලැන්ඩරයක්, හෝමර් සිම්සන් කැලැන්ඩරයක් වගේ ම රුසියානු සැරසිලි බඩු ඔහු ගේ කාමරයේ තබා ගැනීමට තරම් ඔහු සරල යි. 1942 ජනවාරි 8 වැනිද ඔහු උපන් දයි. ඔහු ගේ වීරයෙකු වන ගැලීලියෝ ඉපදී අවුරුදු 300 ක් පිරෙනදයි මහාචාර්ය හෝකින් උපන්නේ.

ඔක්ස්ෆර්ඩ් සරසවියේ අධ්‍යයන කටයුතුවල නිරත ඔහු බොහෝවිට දේශන සඳහා නොගියත් භෞතික විද්‍යා පළමු පෙළ උපාධියක් ලබා ගැනීමට සමත් වූවා. ඔහු සම්පූර්ණයෙන් ම බෙලහීන වුණේ 1973 දීයි. සාමාන්‍ය ජනයා අතර හෝකින් ප්‍රසිද්ධ වුයේ ඔහුගේ A Brief History of Time කෘතියෙන්. 1988 දී ඔහු ලියූ මෙම ග්‍රන්ථය **භාෂා 65 කට පරිවර්තනය වූවා. එය ලෝකයේ මෙතෙක් කලක් ඉහළම අලෙවියක් ලැබූ ප්‍රබන්ධයක් නොවූ කෘතිය යි.** එය ඔහු මහා පොහොසතෙක් බවට පත් කිරීමට සමත් වූවා. ඇමෙරිකාවේ හා ඈත පෙරදිග රටවල මහජන දේශනයක් සඳහා පවුම් 50 000 ක් ගෙවීමට තරම් ඔහු ජනප්‍රිය වුණේ මේ කෘතියෙන්. ඔහු රූපවාහිනී දැන්වීමකට පෙනී සිටීමට අයකළ මුදල පවුම් 100 000 ක්.

ඔහුගේ වාර්ෂික ආදායම පවුම් දසලක්ෂයක් පමණ වෙනවා. කොහොම වුනත් මේ මහා බුද්ධිමතා තඩත්තුවට සැලකිය යුතු මුදලක් වැය වෙනවා.

සාමාන්‍ය ජනයා අතර හෝකින් ප්‍රසිද්ධ වුයේ ඔහුගේ A Brief History Of Time කෘතියෙන්. 1988 දී ඔහු ලියූ මෙම ග්‍රන්ථය භාෂා 65 කට පරිවර්තනය වූවා. එය ලෝකයේ මෙතෙක් කලක් ඉහළම අලෙවියක් ලැබූ ප්‍රබන්ධයක් නොවූ කෘතිය යි. එය ඔහු මහා පොහොසතෙක් බවට පත් කිරීමට සමත් වූවා.

### මට සියල්ල අමතක කළ හැකියි.

හෙදියන් දස දෙනෙකුගේ සේවය ලබා ගන්නා ඔහු උදේ 7.45 ට අවදිවෙනවා. භෞතචිකිත්සක ව්‍යායාමවල නිරතවීමෙන් පසුව සරසවියට ඔහු පැමිණෙන්නේ උදෑසන 11.30 ටයි.

සවස 7.00 ට සරසවියෙන් ඉවත්ව යන ඔහු නින්දට යන්නේ මධ්‍යම රාත්‍රියේදී යි. කොහොමවුනත් මේ කටයුතු සමගින් ඔහු සමඟ 1965 සිට ජීවත් වූ බිරිඳ වූයේ ජේන්. පැය 243 පුරාම හෙදියන් පිරිවරා සිටි මේ විද්වතාගෙන් ඇය දික්කසාද වූවා.

ඉන්පසුව හෝකින් 1995 දී විවාහ වූයේ ඔහු ගේ හෙදියක වගේ ම ඔහුට අදහස් හුවමාරුවට යන්ත්‍රයක් තනා දුන් ප්‍රද්ගලයාගේ හිටපු බිරිඳ වන රලයින් මේසන් සමඟ යි.

මහාචාර්ය හෝකින්ගෙන් දික්කසාද වූ ජේන් තමන්ගේ ජීවිත කථාව ලියමින් හෝකින් නිසා තමන්ගේ ජීවිතය කාලකණ්නි වූ බවට ද්වේෂාරෝපණය කළා. එයට හෝකින් පිළිතුරු දී තිබුණේ "**මගේ ප්‍රසිද්ධිය පිළිබඳ කාරණාවලට මං කැමති නැහැ. කොහොම වුනත් (මගේ ඔළුවේ තියෙන) මාන තුනක (ඒ කියන්නේ මේ ලෝකය ගැන අප දන්නා දිග, පළල හා උසින් යුක්ත) ලෝකයෙන් මිදී මාන 11 ක ලෝකයක් (ඒ කියන්නේ විද්‍යාඥයින් දැන් විශ්වාස කරන්නේ පරමාණුක මට්ටමේ කටයුතු නැත්නම් ක්වොන්ටම් මට්ටමේ කටයුතු සිදුවන්නේ මාන 11 ක පසුබිමක බවයි.)** ගැන හිතන මට මේවා අමතක කර දැමීමට අපහසුවක් නැහැ" යනුවෙන්.

පාලිත අමරසූරිය

## උත්සාහයෙන් ජය ලැබූ තැනැත්තා

**(උයර්න්දවත් නම් ළමා කතාවේ පරිවර්තනය)**

"ස්කොට්ලන්තය කියන රට පිහිටා තියෙන්නෙ අපේ රටට හුඟාක් දුරින්. කාලයක් ඒ රට පාලනය කළේ 'රොබට් බෲස් කියල රජ කෙනෙක්. අල්ලපු රටේ රජතුමාත්, මේ රජතුමාත් එකිනෙකාට සතුරුයි. ඉතින් රොබට් බෲස් රජතුමා අල්ලපු රටේ රජතුමා සමග යුද්ධ කර හය වතාවක් ම පරාජය ලැබුව.

කිප වරක් ම පරාජය හිමිවීම නිසා රොබට් බෲස් රජතුමාගෙ හිතට හරිම දුකයි. දවසක් රජතුමා කාටත් හොරෙන් කැළයට ගිහින් ගහක් යට හෙවනක වැතිරිල ඉඳගෙන තමා ලැබූ පරාජය ගැන බොහෝ වේලා කල්පනා කරමින් සිටිය.

රජතුමා වැතිරී සිටි තැනට ඉහළින් අත්තක මකුළුවෙක් දැලක් බැඳීමට සූදානම් වෙනව. රජුගෙ දැස් නොදැනීම ඒ දෙසට යොමු වුණා.

මකුළුව ගහේ එක තැනක උගේ නූල (පටක) ඇමිණුව. නූලෙ පැත්තක් වෙනත් අත්තක ඇමිණිය යුතුව තිබුණ. ඌ ඒ සඳහා ඉතා වෙහෙසක් ගන්න අයුරු රජුගෙ කල්පනාවට යොමු වුණා. මකුළුව හයවතාවක් නූලත් ඇදගෙන ඒ අත්තට පැන්න.

ඒත් හැමවතාවකදී ම ඌ පහළට වැටුණා. ඒත් ඌ උත්සාහය අත් නොහැර නැවතත් එතැනට පැන්න හත්වෙනි වතාව ඒ. එවර නම් අවශ්‍ය ස්ථානයට නූල ඇදගෙන යන්න ඌට හැකි වුණා.

මකුළුවගෙ මේ ක්‍රියාව රජුගෙ ඉමහත් ආශ්වාදයට හේතු වුණා. ඔහුගෙ හිතටත් උත්සාහය සහ ධෛර්‍ය ඇතුල් වුණා.

"මේ පුංචි සතා කීපවතාවක් හෝ පැනල උගේ නූල අමුණා ගත්ත. ඉතින් මම මොකද තව වරක් උත්සාහ කර නොබලන්නෙ?"

රජු මෙසේ කල්පනා කර තීරණයකට එළඹුණා. තම සේනාව රැස්කරගෙන හොඳින් සංවිධානය වුණා. පෙරටත් වඩා වීර්‍යයෙන්, සත්වන වතාවෙත් සතුරු රජු සමඟ යුද්ධයට එළඹුණා. අභිනව සටන් වැදුණා.

රොබට් බෲස් රජතුමාට ඒ වතාවෙ නම් තමා පැතූ අයුරින් ම ජයග්‍රහණය කිරීමට හැකි වුණා.

පරිවර්තනය :
**ජී. ජී. සරත් ආනන්ද**